# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/3 - 2012 ජූලි මස 16 වැනි සඳුදා - 2012.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1966 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 451 වැනි අධිකාරය වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 (අ) වැනි වගන්තිය යටතේ වූ නියමය.

නියමය

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 451 වැනි අධිකාරය වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 (අ) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පරිසර අමාත්‍ය, අනුර ප්‍රියදර්ශන යාපා වන මම, පහත උපලේඛනයේ සහ එහි මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 18,268.5554 ක විශාලත්වයෙන් යුතු හුරුළු ඔය රක්ෂිත වනාන්තරය වර්ෂ 2012 ක් වූ අගෝස්තු මස 16 වැනි දින සිට හුරුළු ඔය සංරක්ෂණ වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අනුර ප්‍රියදර්ශන යාපා,
පරිසර අමාත්‍ය.

2012 මැයි මස 25 වැනි දින,
බත්තරමුල්ල,
පරිසර අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අළුත් ඔය, මොරකන්ද මහමොරකන්ද, මොරගහකන්ද, හතරුස්කොටුව, තල්බැද්ද සහ රත්මලේ ගම්වල අ.භූ.පි. 10 හි කැබලි අංක 271 ලෙස හඳුන්වන මොරහින්න මූකලාන, කුඹුක් මූකලාන, කරුවලගස් මූකලාන, මොරගස් මූකලාන, හුරුළු මූකලාන, කහටගස්හින්න මූකලාන, හබරණ කැලේ, නිකවැව මූකලාන, වෙලන්ගහ මූකලාන, අලුත් ඔය මූකලාන, මොරගහකන්ද මූකලාන නැමති ඉඩම් ඒකාබද්ධ වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 18,268.5554 ක් විශාලත්වයෙන් යුතු කැළෑ ප්‍රදේශය වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.භූ.පි. 10 හි අනුරාධපුර දිස්ත්‍රික් මායිම ; |
| *නැගෙනහිරට* | : | අ.භූ.පි. 10 හි කැබලි අංක 270, 275, 141, 142, 230, 272, 273 1/2, 273 2/2, 106, 120 1/2, 118, 274 සහ අ.ග.පි. 883 (තිඹිරිගස්වැව ගමේ කොටසක්) ; |
| *දකුණට* | : | අ.භූ.පි. 10 හි කැබලි අංක 275, 273 2/2, 106, 120 1/2, 118, 274, අ. ග. පි. 883 සහ අනුරාධපුර දිස්ත්‍රික් මායිම ; |
| *බටහිරට* | : | අ.භූ.පි. 10 හි අනුරාධපුර දිස්ත්‍රික් මායිම. |
| (ප්‍රමාණයහෙක්ටයාර්) | : | 18,268.5554 |

08 - 14

1A - G 16318 — 635 (2012/07)

## සංශෝධනයි

**වන සංරක්ෂණ ආඥාපනත**

2011.11.08 දින අංක 1731/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වැනි කොටස : (I) වැනි ඡෙදයේ රජයේ නිවේදන යටතේ පළ වූ දැන්වීමෙහි 2 A පිටුවේ 2 වැනි ඡෙදයේ පස්වැනි පේළියේ සඳහන් වෙහෙරගල ගල්එළිය වනාන්තරය යන්න, වෙහෙරගල ගල්එළිය රක්ෂිත වනාන්තරය වශයෙන් නිවැරදි විය යුතුය.

අනුර ප්‍රියදර්ශන යාපා,
පරිසර අමාත්‍ය.

2012 අප්‍රේල් මස 20 වැනි දින,
බත්තරමුල්ල,
පරිසර අමාත්‍යාංශයේ දී ය.

08 - 15